# මාධ්‍ය නිවේදනය

## “සේවා අංශය 2016 දෙවන කාර්තුව තුල සියයට 4.9 ක වර්ධනයක් වාර්තා කරයි"

## 2016 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ශ්‍රී ලංකා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


…………………………………………………………………………………………………….

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 දෙවැනි කාර්තුව සඳහා පවතින මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශකයන් නිෂ්පාදන ප්‍රවේශයට අනුව නිකුත් කොට ඇත.

2016 වර්ෂයේ දෙවන කාර්තුව තුලදී පැවති අයහපත් කාලගුණ තත්වය රටේ ආර්ථිකය කෙරෙහි බලපෑමක් ඇති කොට ඇත. 2015 අවසන් කාර්තුව තුල දී ආරම්භ වූ දැඩි වියලි කාලගුණ තත්ත්වය මේ වසරේ අප්‍රේල්-මැයි දක්වා පැවතුනු අතර මෙම වසරේ මැයි- ජුනි කාලය අතරතුර මධ්‍ය කඳුකර ප්‍රදේශ සහ තෙත් කලාපයට අදාළ බොහෝ ප්‍රදේශවල පැවති අධික වැසි සහිත කාලගුණ තත්වයන් සමස්ත කෘෂි-ආර්ථික කටයුතු කෙරෙහි බලපෑමක් එල්ල කොට ඇත. එමෙන්ම මෙම අහිතකර කාලගුණ තත්ත්වය බස්නාහිර පළාතේ නිදහස් වෙළඳ කලාප හා ඒ ආශ්‍රිතව අයහපත් ලෙස බලපා ඇත. එය මෙම කාර්තුව තුල කර්මාන්ත ආර්ථික ක්‍රියාකාරකම්හි වර්ධනය අඩුවීම කෙරෙහි සැලකිය යුතු මට්ටමින් බලපා ඇත.

ශ්‍රී ලංකාවේ මුළු දළ දේශීය නිෂ්පාදිතය 2016 වර්ෂයේ දෙවැනි කාර්තුව (අප්‍රේල්, මැයි, ජුනි) සඳහා ස්ථාවර මිල ගණන් (2010) යටතේ රුපියල් මිලියන 2,130,240 ක් ලෙස වාර්තා වේ. මෙය 2015

වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා වාර්තා වූ මුළු දළ දේශීය නිෂ්පාදිතය වූ රුපියල් මිලියන 2,075,805 ට සාපේක්ෂව සියයට 2.6 ක ධනාත්මක වර්ධනයක් වේ.

2016 වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා, ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු මුළු දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වයන් පවතින මිල ගණන් යටතේ පිළිවෙලින් සියයට 7.7 ක්, සියයට 26.6 ක්, සියයට 55.8 ක් සහ සියයට 9.8 ක් වේ. මෙහිදී මෙම කාර්තුව සඳහා සේවා ක්‍රියාකාරකම් සියයට 4.9ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇති අතර කර්මාන්ත ක්‍රියාකාරකම් සියයට 2.2 ක වර්ධනයක් වාර්තා කර ඇත. එනමුත් කෘෂිකාර්මික ආර්ථික ක්‍රියාකාරකම් සියයට 5.6ක පසුබෑමකට ලක්වී ඇත.

2015 වසරේ දෙවැනි කාර්තුවට සාපේක්ෂව 2016 දෙවැනි කාර්තුව සඳහා ප්‍රධාන කෘෂි-ආර්ථික ක්‍රියාකාරකම් අතුරින් “වී වගා කිරීම”, “තේ වගා කිරීම”, “රබර් වගා කිරීම” සහ “කරදිය ධීවර කර්මාන්තය” යන උප ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 17.9ක්, සියයට 12.2ක්, සියයට 8.2ක් සහ සියයට 7.8 ක් වශයෙන් පසුබෑමක් වාර්තාකර ඇති අතර පොල් වගාව ඇතුලත් “තෙල් සහිත පලතුරු බෝග වගාව”, ” සත්ව නිෂ්පාදන” සහ “වන වගා සහ දැව” යන උප ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 1.0ක්, සියයට 1.7ක් සහ සියයට 2.0 ක් ලෙස ධනාත්මක වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කර්මාන්ත අංශය සැලකීමේදී විශේෂයෙන් 2016 දෙවැනි කාර්තුව තුලදී මෙම අංශය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය සියයට 26.6ක් වේ. එසේම සමස්ත කර්මාන්ත ක්ෂේත්‍රය මෙම කාර්තුව තුල දී සියයට 2.2කින් වර්ධනය වී ඇත. කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා ඉහලම දායකත්වයක් ලබා දෙන “ඉදිකිරීම් කර්මාන්තය” 2015 දෙවනකාර්තුවට සාපේක්ෂව 2016 දෙවන කාර්තුව තුලදී සියයට 6.9ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. එමෙන්ම “විදුලිය නිෂ්පාදනය” සහ “ගෘහභාණ්ඩ නිෂ්පාදනය” 2016 දෙවන කාර්තුව තුලදී පිළිවෙලින් සියයට 7.0ක් සහ සියයට 4.4ක් ලෙස වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේම දළ දේශීය නිෂ්පාදනයට ඉහල දායකත්වයක් ලබා දෙන “ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය” සහ “රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන”යන ආර්ථික කටයුතු 2015 දෙවන කාර්තුවට සාපේක්ෂව පිලිවෙලින් සියයට 0.4ක සහ 0.9ක වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේම මෙම කාල සීමාව තුලදී “පතල් හා කැනීම්” කර්මාන්තය සියයට 4.9ක වර්ධන වේගයක් වාර්තා කොට ඇත.

සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට ඉහලම දායකත්වයක් ලබා දෙන සේවා ක්‍රියාකාරකම් 2016 වර්ෂයේ දෙවැනි කාර්තුව තුල දී සියයට 4.9ක ඉහල වර්ධන වේගයක් වාර්තාකර ඇත. 2015 දෙවැනි කාර්තුව හා සැසඳීමේදී “ විදුලි සංදේශ” , “මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා කටයුතු” , “රක්ෂණ සේවා සැපයීම”, “තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතු”, සහ “අධ්‍යාපන සේවා ” යන සේවා උප ක්‍රියාකාරකම් පිලිවෙලින් සියයට 21.2ක් , සියයට 14.5ක් , සියයට 15.1ක්, සියයට 3.5ක් සහ සියයට 10.5ක්

වශයෙන් තව දුරටත් ඉහල වර්ධන අනුපාතිකයන් 2016 දෙවැනි කාර්තුව තුලදී වාර්තා කර තිබීම මෙම අංශයේ සමස්ත වර්ධනයට බලපා ඇත.

2016 දෙවැනි කාර්තුවට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ පල කොට ඇත.

ආචාර්ය ඒ. ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව